# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1703/46 - 2011 අප්‍රේල් 29 වැනි සිකුරාදා - 2011.04.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2010.

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රෝහණ රාජපක්ෂ වන මම, විදුලිබල හා බලශක්ති විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා මෙම නියමය මගින් -

(1) මන්නාරම ද්‍රෝණියේ තෙල් හා ගෑස් ගවේෂණය සඳහා වූ ව්‍යාපෘතිය, ඉහත කී පනතේ කාර්ය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගත් නිවේදනය 2011 මාර්තු මස 01 වැනි දින අංක 1695/6 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ බවටත් ;

(2) මන්නාරම ද්‍රෝණියේ තෙල් හා ගෑස් ගවේෂණය සඳහා වූ ව්‍යාපෘතිය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් බවට ප්‍රකාශ කිරීමට 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලබා ගෙන ඇති බවටත් ;

(3) ඉහත කී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය "මන්නාරම ද්‍රෝණියේ තෙල් හා ගෑස් ගවේෂණය සඳහා වූ ව්‍යාපෘතිය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන බවට සහ ඒ ව්‍යාපෘති සමාගම කායින් ලංකා පුද්ගලික සමාගම බවටත් ;

(4) ඉහත කී "මන්නාරම ද්‍රෝණියේ තෙල් හා ගෑස් ගවේෂණය සඳහා වූ ව්‍යාපෘතිය" 2008 ජූලි මස 07 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ව්‍යාපෘති සමාගම අතර ඇතිකරගත් ඛණිජ තෙල් සම්පත් ගිවිසුමේ සඳහන් ගවේෂණ කටයුතු ආරම්භ කළ යුතු බවටත් ; සහ

(5) මේ නියමයේ උපලේඛනයේ සඳහන් ප්‍රඥප්තිවලින් කරනු ලබන නිදහස් කිරීම්, ව්‍යාපෘති සමාගමට හෝ 2003 අංක 26 දරන ඛනිජ තෙල් සම්පත් පනතේ අර්ථානුකූලව මෙම ව්‍යාපෘතියට පත් කරන ලද උපකොන්ත්‍රාත්කරුවන්ටත් අදාළ විය යුතු බවටත් ; මෙම නිදහස් කිරීම් 2008 ඔක්තෝබර් මස 16 වැනි දින සිට 2016 ඔක්තෝබර් මස 15 වැනි දින දක්වා වූ අවුරුදු අටක (08) කාලයක් සඳහා වලංගු විය යුතු ය. එකී අවුරුදු අටක (08) කාලය ඉකුත් වීමෙන් පසුව එවකට බලපාන බදු අදාළ විය යුතු බවටත්,

ප්‍රකාශයට පත් කරමි.

1A - G 14478 —680 (2011/04)

උපලේඛනය

*නිදහස් කිරීම ලබා දීමට අදාළ පනත් සහ වෙනත් ආශ්‍රිත සීමාවන්*

1. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත
   * සංස්ථාපිත බදු
   * පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් නිදහස ලැබේ.-
     (i) ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගත් විදේශ ණය මත පොළිය,
     (ii) උපදේශකයින්ට ගෙවන ලද තාක්ෂණික ගාස්තුව.
2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත.
3. 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත.
4. 2005 අංක 05 දරන මුදල් පනත (ගොඩනැගිලි කර්මාන්ත සහතික අරමුදල් අයකිරීම්).
5. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන පනත)
6. 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත
7. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත -2003 අංක 26 දරන ඛනිජ තෙල් සම්පත් පනතේ අර්ථානුකූලව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම නමින් හෝ මෙම ව්‍යාපෘතියට පත්කරන ලද උප කොන්ත්‍රාත්කරුවන්ගේ නමින් ආනයනය කරන ලද සියලුම ප්‍රාග්ධන භාණ්ඩ සඳහා රේගු බදු අදාළ වේ. මෙම භාණ්ඩ ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලබන පරිදි ව්‍යාපෘතිය මගින් ක්‍රියාවට නංවන ගවේෂණ කටයුතුවලට පමණක් ප්‍රයෝජනයට ගන්නා භාණ්ඩ විය යුතු අතර 2008 ඔක්තෝබර් මස 16 වැනි දින සිට ආරම්භවන වසර 8 ක සීමාවක් සඳහා වූ ගවේෂණ බලපත්‍ර කාලසීමාව තුළ දී ව්‍යාපෘතියට අවශ්‍ය වන සහ ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන උපකරණ, යන්ත්‍රසූත්‍ර, ද්‍රව්‍ය, සැපයුම් සහ පරිභෝජනික දේ එම භාණ්ඩවලට ඇතුළත් විය යුතු ය. එසේ වුව ද ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් කොන්දේසි එම සමාගම විසින් සපුරාලිය යුතු වේ.

බැසිල් රෝහණ රාජපක්ෂ,
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2011 අප්‍රේල් මස 30 වැනි දින දීය,
කොළඹ දී ය.

05-362

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.